# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2296/31- 2022 සැප්තැම්බර් මස 09 වැනි සිකුරාදා - 2022.09.09**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*ඉඩම් අමාත්‍යාංශ ගොනු අංකය*: 4-3/8/2020/CEB/04.
*මගේ අංකය*: 3/6/4/5.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වන වගන්තියේ (1) උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තරය* :-

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 909 ඉඹුල්ගොඩ ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සර්වේ ජනරාල් විසින් මැන සකස් කරන ලද මු.පි.කු. 2502 හා 2022 පෙබරවාරි මස 28 දිනැති මූලික පිඹුරේ පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කැබැල්ල :

01. කැබලි අංක **1**
ඉඩමේ නම: ඌරාවේකුඹුර; මුල් හිමිකම් කියන අය: විහාරාධිපති හිමි, වෙහෙරපිටිය විහාරස්ථානය, පොල්ගහවෙල; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0379.

ඉහත සඳහන් ඉඩමට/ පරවශතාවට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 සැප්තැම්බර් මස 23 වැනි දින පෙ.ව.10.00ට පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2022 සැප්තැම්බර් මස 09 වැනි දිනට මත්තෙන් එම ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම/ පරවශතාවය ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ඩී. අනෝමා දිසානායක,
ප්‍රාදේශීය ලේකම්,
පොල්ගහවෙල.

2022 අගෝස්තු මස 31 වැනි දින,
පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 9-0072




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ශුද්ධිපත්‍රිකාව

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : EP/LD/9/4/3V.
*සංචාරක හා ඉඩම් අමාත්‍යාංශයේ අංකය* : 03/ජේ/76/E/706.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ අංක 401/10 හා 1986.05.15 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට්* පත්‍රයේ 1A පිටුවේ පළ කරන ලද මාගේ දැන්වීමේ ඉඩම් විස්තරය යටතේ "කැබලි අංක 44" යන්න කැබලි අංක 344 ලෙස නිවැරදි විය යුතු බව මෙයින් දන්වා සිටිමි.

චතුරංග ගුණසේකර,
ප්‍රාදේශීය ලේකම්,
ඇල්පිටිය.

2022 අගෝස්තු මස 31 වැනි දින,
ඇල්පිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 09-0073

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.